**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන් දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් සිදු කරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම්වල මුළු එකතුව රු.2,346,900,420 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2019 දෙසැම්බර් 31 දිනට එම වත්කම්වල එකතුව රු.2,277,821,571 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එම ශේෂයන් අතර රු.69,078,849 ක වෙනසක් නිරීක්ෂණය විය. | වත්කම්වල එකතු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | භාණ්ඩාගාරය නියම කළ දිනයේදී වත්කම් ඇතුළත් නොකිරීම නිසා රු.66,977,166 ක් ද පරිපූරක ගිණුම් සාරාංශයට දත්ත ඇතුළත් කිරීම 2020 වර්ෂයේ දිනයකින් සිදු කිරීම නිසා රු.1,827,292 ක් ද හඳුනාගත නොහැකි රු.274,390 ක ශේෂයක් ද හේතුවී ඇති අතර ඉදිරියේදී මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | කඹුරුපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පැරණි නිල නිවස සහ එම ඉඩම තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාවක් නොමැතිව රු.4,500,000 කට ගිණුම් ගත කර තිබුණි | තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අදාල වත්කම් තක්සේරු කර වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා ලබාගෙන නිවැරදි කරන බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් වශයෙන් එකතුව රු.18,947,260 ක් ගෙවා තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.11,552,017 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය වර්ෂය අවසානයට තව දුරටත් අයවිය යුතු අත්තිකාරම් මුදල ගිණුම්ගත කළ යුතුය. | මෙම අත්තිකාරම් මුදල නියමිත වැය විෂයයන්ට අදාළ වර්ෂයන්හිදී හර කර, අදාල ගිණුම් වර්ෂයන්හිදී වියදම් ලෙස වත්කමට අදාලව වැය කර ඇති බවත් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් කර ඇති බවත්. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂය රු.226,891,833 ක් ලෙස දක්වා තිබුන ද එම ණය ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි රු.179,515 ක ශේෂයක් ඇතුළත්ව තිබුණි. එම ණය ශේෂයන් වත්කම් ලෙස දැක්වීම සම්බන්ධයෙන් මෙන්ම එම ශේෂය අයකර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ද අවිනිශ්චිතතාවයක් ඇතිවී තිබුණි. | කඩිනමින් ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට තව දුරටත් කටයුතු කරන බව. |

## 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය** | | |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන කමිටු, තාක්‍ෂණික ඇගැයීම් කමිටු හා සහාය කාර්යය මණ්ඩලයට අදාළ පැමිණීමේ ලේඛන පවත්වා නොතිබුණි. | යොමුගත මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වාගත යුතුය. | ඉංජිනේරු අංශය සහ සැලැසුම් අංශය, ප්‍රසම්පාදන ආකෘතිය අනුව අත්සන් ලේඛන වෙන් වෙන්ව පවත්වාගෙන යනු ලබන බව. |

### 1.6.3 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 09 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 07 කට 2020 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.951,034,303 ක් විය. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452(1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතු අතර, එම විමසුම්වලට වහාම පිළිතුරු ලබා දිය යුතුය. එසේ පිළිතුරු ලබාදීම ප්‍රමාද විය හැකි විමසුම් වේනම් ඒ සඳහා අතුරු වාර්තාවක් යැවීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී කඩිනමින් පිළිතුරු ලබාදීමට කටයුතු කරන බව . |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් හා තව දුරටත් ක්‍රියා කිරීමට ඇති හානි හා පාඩු ප්‍රකාශයේ ඇතුළත් එකතුව රු. 12,001,695 ක් වූ ශේෂවලට අදාල ලිපිගොනු 03 ක් විගණනයට ඉදිරිපත් නොවුණි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම්වලට අදාල ලේඛන විගණනය වෙත ලබාදිය යුතුයි. | මුහුද ගොඩ ගැලීමෙන් වූ අලාභ හානි සම්බන්ධ ලිපිගොනු තුන හැර අනෙක් ලිපිගොනු ඉදිරිපත් කළ බව. |

### 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු විය. එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

**1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| i. xxiv පරිච්ඡේදයේ 3.6 ඡේදය | 6,845,234 | දෙවිනුවර හා කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි සමාලෝචිත වර්ෂය තුල අළුතින් ලබාදී තිබූ ණය සඳහා විධිමත් පරිදි වාරික අයකිරීම් සිදුකළ යුතු වුවද එය නොසළකා වාරික ලෙස රු.2,500 බැගින් අයකර තිබුණි. | යොමුගත ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | ආයතන සංග්‍රහය අනුව වැටුප මත සියයට 10 සීමාවට යටත්ව අය කළයුතු බවට විෂයය නිලධාරීන් දැනුවත් කළ බව. |
| ii. xxiv පරිච්ඡේදයේ 4.4 ඡේදය හා 4.5 ඡේදය | 179,515 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක වැඩ තහනමට ලක්වූ නිලධාරීන් දෙදෙනෙකුගේ හා සේවය හැරගිය එක් නිලධාරියෙකුගේ දීර්ඝ කාලයක සිට අය නොවන ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | යොමුගත ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් දරනු ලබන උත්සාහය අත්හැර නොමැති බව. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---------------

| | | | | |
|---|---|---|---|---|
| i.මුදල් රෙගුලාසි 104(4) | 1,383,625 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක සිදුවී තිබූ වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 104(4) අනුව අවසාන පරීක්ෂණ මණ්ඩලය පත්කර ඇති අතර එම වාර්තා අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. |
| ii.මුදල් රෙගුලාසි 109(1) | 1,793,424 | වර්ෂ 2005 සිට 2019 දක්වා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක සිදුවී තිබුණු වාහන අනතුරු 11 ක් සඳහා 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිරි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 109(1) අනුව අවසාන පරීක්ෂණ මණ්ඩල වාර්තා කඩිනමින් ලබා ගෙන ඉදිරි කටයුතු සිදුකරන බව. |
| iii. මුදල් රෙගුලාසි 569 | 1,873,454 | හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් තැන්පතුවට අදාළ විස්තර ප්‍රමාණවත් පරිදි පොදු තැන්පත් ලේඛනයේ දක්වා නොතිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. | මෙම මුදල පිළිබඳව සොයා ගැනීම අපහසු බැවින් පැරණි ගොනු විශ්ලේෂණය කර පොදු තැන්පත් ලේඛනය නිවැරදි කිරීමට හා පොලී මුදල් රාජ්‍ය ආදායමට බැර කිරීමට උපදෙස් ලබා දුන් බව. |
| iv.මුදල් රෙගුලාසි 571 | 123,610,614 | වර්ෂ 2011 සිට 2017 දක්වා කාල පරාසයට අයත් වසර 02 ඉක්මවූ තැන්පතු 207 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම නිසා තැන්පතු නිරවුල් කිරීමට නොහැකි වූ බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් කළ යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එසේ සිදුකර නොතිබුණි. | යොමුගත චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. | චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි ඉන්ධන පරීක්ෂාව සිදු නොවූවද කාලානුරූපව ඉන්ධන පරීක්ෂාව සිදුකරන බව. |
| (ඈ) ඉඩම් සංවර්ධන ආඥා පනතේ ඉඩම් නියෝග 180 | - | සති 02 කට වරක් කොට්ඨාශයේ අනවසර ඉඩම් අල්ලා ගැනීම් / ඉදිකිරීම් සම්බන්ධයෙන් වාර්තාවක් සෑම ග්‍රාම නිලධාරීවරයකු විසින්ම ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. | යොමුගත ඉඩම් නියෝග අනුව කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීමට කටයුතු කරන බව. |

**1.6.6 අවිධිමත් ගනුදෙනු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **---------------------** | **-------------** | **-------------------------** |
| (අ) තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ ඉඩමක් අවුරුදු 30 ක දීර්ඝකාලීන බදු පදනමට සමුපකාර සමිතියකට ලබාදී බදු කාලය අවසන් වී අවුරුදු 20 ක් ඉක්මවා තිබුන ද ගිවිසුම දීර්ඝ කිරීමට හෝ එම ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. බදුකරු විසින් එහි ගොඩනැගිලි ඉදිකර අතුරු බදු දී ආදායම් උපයන බව නිරීක්ෂණය විය. | නියමිත කාලය අවසන් වීමට පෙර බදු ගිවිසුම දීර්ඝ කිරීමට හෝ ඉඩම රජයට ලබා ගැනීමට කටයුතු කළයුතු අතර ලබාගත යුතු බදු මුදල් නිසි ලෙස අයකර ගත යුතුය. | නිරීක්ෂණය පිළිගන්නා බවත්, මේ වනවිට ඉඩම් කොමසාරිස්වරයාගේ උපදෙස් අනුව රජයට අහිමි වූ ආදායම අයකර ගැනීමට මුලින් වාර්ෂික බදුකරයක් සකස් කිරීමට පියවර ගෙන ඇති බවත්. |
| (ආ) හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ ඉඩමක් 1996 වර්ෂයේ සිට සමුපකාර සමිතියක් විසින් බුක්ති විඳින අතර බදු ගිවිසුම කාලීනව සංශෝධනය නොකිරීම හා දීර්ඝකාලීන බදුකරය සකස් නොකිරීම හේතුවෙන් රජයට බදු ආදායම් අහිමි වී තිබුණි. මිනින්දෝරු වාර්තාව අනුව අනවසර පදිංචිකරුවන් 04 දෙනෙකු ඉඩමේ කොටසක් බුක්ති විඳින බව දක්වා ඉන්පසු ගොනුව අක්‍රීයව පැවතුණි. | කාලීනව බදු ගිවිසුම සංශෝධනය කළ යුතු අතර දීර්ඝකාලීන බදුකර නියමිත දිනට සකස් කර බදු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. එසේම අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ද කඩිනමින් ක්‍රියා කළ යුතුය. | දීර්ඝකාලීන බදුකරයක් සැකසීම සඳහා 1999 අප්‍රේල් 30 දින අදාල වාර්තා දකුණු පළාත් ඉඩම් කොමසාරිස්වරයා වෙත යවා ඇත. බදුකරු සමඟ සාකච්ඡා කර බදු ඔප්පු කෙටුම්පතෙහි ඉඩම් ප්‍රමාණය සංශෝධනය කිරීමට හා අනවසරකරුවන් පිළිබඳව ඉදිරියේදී කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙවිනුවර පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල රජයේ ඉඩම් ආඥා පනතේ නියෝග 191(2) ට අනුකූල නොවන ලෙස, 1997 ඔක්තෝබර් 04 දින සමුපකාර සමිතියකට ගිවිසුමක් මගින් බදු දී සංශෝධිත බදු මුදල් ගෙවීමට අපොහොසත් වීම මත 2019 මාර්තු 30 දිනට රු.6,910,183 ක ආදායම් හිඟව පැවතුන ද දීර්ඝකාලීන බදුකරයක් සකස් කර නොතිබුණි. | රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේදී ඉඩම් ආඥා පනතේ නියෝග සෑමවිටම අනුගමනය කළ යුතුය. ඒ අනුව බදු ගිවිසුම සැකසීමේදී ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතු අතර පවතින බදු ගිවිසුම කාලීනව සංශෝධනය කර බදු මුදල් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ඉඩම ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සතු අත්පත් කරගත් ඉඩමක් බවත් දීර්ඝකාලීනව බදු දිය නොහැකි බවත් ඉඩම් අමාත්‍යාංශය ප්‍රාදේශීය ලේකම් දෙවිනුවර වෙත දන්වා එවා ඇති බව. |
| (ඈ) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රිට්රිට් වත්ත ඉඩමේ පර්චස් 10 බැගින් වූ ඉඩම් කට්ටි 22 ක් කර්මාන්තකරුවන් වෙත බෙදාදී තිබූ අතර එක් කර්මාන්තකරුවකු ඉතිරි ඉඩම් කොටස් ද ලබා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලීමක් කර මැනුම් කටයුතු සඳහා රු.57,500 ක් ගෙවා තිබුන ද 2017 වර්ෂයේ එම ආයතනය වසා දමන තෙක් දීර්ඝකාලින බදුකර සකස් කර නොතිබුණි. | රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේදී කාලීනව බදු ගිවිසුම් සකස් කර රජයට අයකර ගත යුතු බදු ආදායම් රැස්කර ගත යුතුය. | දීර්ඝකාලීන බදුකරයක් සැකසීම සඳහා ආයතන 04 ක එකඟතාවය ලබාගත යුතු වුවත් නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශ පමණක් ලැබී ඇති බවත්, මෙම ඉඩම ප්‍රාදේශීය සභාව සතු බැවින් බිම් බදු අයකිරීමට කටයුතු කර ඇති බවත්. |
| (ඉ) | වසා දමන ලද මාර/වේරදුව බණ්ඩාරනායක විදුහල් භූමිය 2012 පෙබරවාරි 15 දින වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් සඳහා විහාරස්ථානයක් වෙත පවරා දීමේදී රජයේ ඉඩම් ආඥා පනතේ නියෝග අංක 200 ට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර විගණිත දිනය දක්වාම වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවා නොතිබුණි. විහාරස්ථානය සහ චීන සමාගම විසින් ඇතිකරගත් බදු ගිවිසුම් 02 හි කොන්දේසි අංක 02 අනුව බදුකුලී ගෙවීමක් සිදු නොකරන බව දක්වා තිබූ අතර මුල් බදු ගිවිසුම මේ දක්වාම විගණනයට ඉදිරිපත් නොකෙරුණි. විගණනයෙන් පසුව ප්‍රාදේශීය ලේකම්වරයා වෙත විහාරාධිපති හිමි රු.895,000 ක් ගෙවීම් කර තිබුන ද තවත් රු.1,790,000 ක් අයවීමට පැවතුණි. | රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේදී රජයේ ඉඩම් නියෝග අනුගමනය කළයුතු අතර නිවැරදි බදු ගිවිසුම් සකස් කර ඒ අනුව බදු ආදායම් රැස්කිරීමට ක්‍රියා කළ යුතුය. එසේම කඩිනමින් හිඟ බදු අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ඊ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් 2018/2019 බදු වර්ෂයේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීම සඳහා අදාල කර ගතයුතු මාර්ගෝපදේශවලට අනුව බදු අයකළ යුතු වුවත් 2019 අප්‍රේල්, මැයි හා ජූනි මාස තුල අවස්ථා 05 කදී නිලධාරින් 03 දෙනෙකු සඳහා ගෙවීම් කරන ලද එකතුව රු.830,010 ක් වූ දීමනා උපයන විට ගෙවීම් බදු සඳහා අදාල කරගෙන නොතිබුණි. | නිවැරදි ලෙස බදු ගණනය කිරීම් සිදුකළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ඨ) | දෙයියන්දර ජාතික පාසල් තාප්පය, මහා මන්තින්ද පිරිවෙනේ ගොඩනැගිලි ඉදිකිරීම හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ මාර්ග 11 කට අදාල ලංසු කැඳවීම් සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම පූර්ව සූදානමකින් හා මනා අධීක්ෂණයකින් තොරව සිදුකිරීමෙන් එම දැන්වීම් අවලංගු කිරීමට මෙන්ම නැවත දැන්වීම් පළකිරීම වෙනුවෙන් රු.107,525 ක මුදලක් අමතරව වැයකර තිබුණි. | දැන්වීම් පළ කිරීමේදී වඩා සැළකිලිමත් ලෙස හා ඵලදායීව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ඩ) | කොටුව ක්‍රීඩාංගනය මාතර දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පළාත් ඉඩම් කොමසාරිස් සහ ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ විධිමත් අනුමැතියකින් තොරව පවරාගෙන තිබුණි. දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් මත මාතර දිස්ත්‍රික් රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමයක් පිහිටුවා ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු සංගමයට පවරා ඒ අනුව 2019 ජනවාරි 01 දින සිට 2020 පෙබරවාරි 28 දින දක්වා කාලයට අදාල ක්‍රීඩාංගනය වෙන් කිරීමේ ආදායම වන එකතුව රු.246,000 ක් ක්‍රීඩා සංගමයේ ගිණුමට බැර කර තිබුණි. ක්‍රීඩාංගනය ලබාදීමේදී අයකළ යුතු ගාස්තු දිස්ත්‍රික් ලේකම්වරයා විසින් තීරණය කර තිබූ නමුත් ඒ සඳහා ද විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලිපි ශීර්ෂ යොදා ගනිමින් වෙන්කිරීම් දින ලබාදී සංගමයේ රිසිට්පත් නිකුත් කර මුදල් ලබාගෙන තිබුණි. තවද මෙම ක්‍රීඩාංගනය සම්බන්ධව පවත්වාගත යුතු නඩත්තු ලේඛනය, ඉන්වෙන්ට්‍රි ලේඛනය, විදුලිය/ජලය පිළිබඳ ලේඛන පවත්වා නොතිබූ අතර ක්‍රීඩාංගනය වෙන්කිරීමේ ලේඛනය විධිමත්ව යාවත්කාලීන කර නොතිබුණි. | රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේදී අදාල ආයතන වෙතින් විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. එසේම රජයට හිමිවිය යුතු ආදායම් අවිධිමත් ආකාරයට යොදා නොගත යුතු අතර එම ආදායම් රජයේ ආදායම් ලෙස පමණක් සළකා කටයුතු කළ යුතුය. අදාල ලේඛන නියමිත පරිදි පවත්වා යාවත්කාලීන කළ යුතුය. | මෙම ක්‍රීඩාංගනයේ පරිපාලනය හා කළමනාකාරිත්වය පමණක් පවරා ගන්නා ලද බව වාර්තා කර ඇත. වර්තමානයේ සාමාජිකයන් ලෙස රජයේ නිලධාරීන් 11 ක් සිටින අතර ඔවුන්ගෙන් යාවජීව සාමාජික මුදල් ලෙස රු.6,600 ක් සංගමය සතු බව දක්වා ඇත. අවබෝධතා ගිවිසුමක් මගින් ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු සඳහා වෙනම ඉතිරි කිරීමේ ගිණුමකට මෙම ආදායම බැර කරන බව ද දන්වා ඇත. දිස්ත්‍රික් ලේකම්වරයා මීල කමිටුවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරන බැවින් වෙනත් අනුමැතියක් අවශ්‍ය නොවන බව හා ලේඛන යාවත්කාලීන කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බවත්. |

**2. මූල්‍ය සමාලෝචනය**

---

**2.1 වියදම් කළමනාකරණය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තුව තුල ප්‍රතිපාදන වෙන්වී නොතිබුණු අංක 262-1-1-0-2509 දරන වැය විෂය සඳහා රු.8,100,000 ක අතිරේක ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණු අතර අදාල ව්‍යාපෘතිය නිම නොකිරීම නිසා රු.2,190,686 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | ලබාදී ඇති ප්‍රතිපාදන අදාල ව්‍යාපෘතිවල යෙදවීම සිදුකළ යුතුය. | භාණ්ඩාගාරය වෙතින් අග්‍රිම ලබා නොදීම නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත නොහැකි වූ බව. |
| (ආ) | වැය විෂය අංක 262-1-1-0-1003 හා 262-1-2-0-1003 සඳහා එකතුව රු.6,380,000 ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. | ඇස්තමේන්තු කිරීම, සැලසුම් කිරීම නියමිත පරිදි හා නිවැරදිව කළ යුතුය. | මාසිකව රු.2,500 ක දීමනාවක් 2019 ජූලි සිට රජයේ නිලධාරීන්ට ගෙවීම සඳහා අතිරේක ප්‍රතිපාදන සලසා ගත් බව. |
| (ඇ) | වැය විෂයයන් 07 ක් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 23 කින් ප්‍රතිපාදන මාරු කර වියදම් දරා තිබුණි. එය එම ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 47 දක්වා වූ එනම් රු.3,990 සිට රු.22,711,200 ක් දක්වා වූ පරාසයක අගයයන්ගෙන් සමන්විත වී තිබුණි. | අවශ්‍යතා අනුව නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීම කළ යුතුය. | වාර්ෂික වැටුප් වැඩිවීමත් සමඟ අනෙකුත් දීමනා වැඩිවීම, අතිරේක ප්‍රතිපාදන වෙන් නොවීම සහ ඉන්ධන මිල වැඩිවීම හේතුවෙන් අතිරේක ප්‍රතිපාදන මාරු කළ බව. |
| (ඈ) | පුනරාවර්තන වැය විෂයයන් 03 කට හා මූලධන වැය විෂයයන් 05 කට අදාලව සියයට 07 සිට සියයට 37 දක්වා වූ පරාසයක් තුල ප්‍රතිපාදන ඉතිරිවීම් වාර්තා වී තිබුණි. | නියමිත පරිදි හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කිරීම කළ යුතුය. | සැලසුම් කළ පරිදි වියදම් සිදු නොවීම සහ ප්‍රමාණවත් අග්‍රිම නොලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. |
| (ඉ) | වැය විෂයයන් 23 ක් සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් සියයට 1.6 සිට සියයට 100 දක්වා එනම් රු.6,000 සිට රු.14,371,000 ක් දක්වා වූ පරාසයක අගයයන්ගෙන් වෙනත් වැය විෂයයන්ට මාරු කර වියදම් දරා තිබුණි. | ඇස්තමේන්තු කිරීම, සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම නියමිත පරිදි හා නිවැරදිව කළ යුතුය. | 1401 වැය විෂය සඳහා වන ප්‍රතිපාදන දුම්රිය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ උපදෙස් අනුව ද අනෙකුත් වැය විෂයයන් ගේ ඉතිරිවීම් මනා කළමනාකරණයකින් මාරු කර වියදම් දරා ඇති බව. |

## 2.2 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

වෙනත් අමාත්‍යාංශ 28 ක්, දෙපාර්තමේන්තු 19 ක්, ජනාධිපති ලේකම් කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ එකතුව රු.මිලියන 7,781.87 ක ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 3,846.26 ක් පමණක් උපයෝජනය කර රු.මිලියන 3,935.6 ක් හෙවත් සියයට 50.57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මාතර නිල්වලාඑළිය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාතර රිවර්සයිඩ් උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතියේ ගෘහ නිර්මාණ කටයුතු සඳහා අවස්ථා දෙකකදී එකතුව රු.14,072,072 ක මුදලක් වැය විෂයය අංක 155-2-13-6-2509 යටතේ ගෙවීම් කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** මෙම ව්‍යාපෘතිය මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘතියක් බැවින් දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ඉහත වියදම් දැරීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇති බව නිරීක්ෂණය නොවීය.<br>• අදාළ ගෘහ නිර්මාණ ශිල්පියා විසින් සපයන ලද සේවය පිළිබඳ විස්තර,<br>• සේවය තහවුරු කිරීම සඳහා අමාත්‍යාංශයේ නිර්දේශ<br>• අමාත්‍යාංශය අතර ඇතිකර ගත් ගිවිසුම,<br>• ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ උපදේශන ආයතනය ලබා දුන් තහවුරු කිරීම්,<br>• ලබාදුන් සේවාව සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය මගින් හෝ වෙනත් ආයතනයක් වෙතින් (UDA) ගෙවීම් සිදු කර තිබේද යන්න පිළිබඳ තහවුරු කිරීම<br>• කැබිනට් සංදේශය අනුව ව්‍යාපෘති අදියර 05 ක් නිර්මාණ යෙදවුම් වටිනාකම වන රු.772,868,820 ක් සඳහා ගෘහ නිර්මාණකරුවන්ගේ සංගමය විසින් 1996 සම්මත කරගත් ගෙවීම් අනුපාත අනුව සිදුකළ ගණනය කිරීම | ගෙවීම් සිදුකිරීමේදී ලබාදෙන ලද සේවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය වන ගිවිසුම සහ අනෙකුත් ලේඛන ලබාගත යුතුය. | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |
| **(ii)** දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ඉහත ගෙවීම් කිරීමේ දී අදාළ වගකීම්වලින් නිදහස් කරන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිපියක් යොමුකර තිබුණද ඒ සඳහා පිළිතුරු ලැබී නොතිබුණු අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී මේ සම්බන්ධයෙන් දැනුවත් කර අනුමැතිය ලබාගෙන ඇති බව නිරීක්ෂණය නොවීය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාගේ අවධානය සඳහා යොමුකළ යුතු වීම. | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |

| | | |
|---|---|---|
| **(iii)** 2019 අගෝස්තු 23 දින ගෙවන ලද රු.5,410,081 ක් වූ ගෘහ නිර්මාණ ශිල්පී දීමනාව සඳහා ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස් 07 හි එකතුව රු.24,306,500 ක් වීමෙන් ගෙවන ලද වටිනාකම හා නොසැසඳෙන බව නිරීක්‍ෂණය විය. | ඉන්වොයිස්වල දක්වා ඇති වටිනාකම් සහ ගෙවීම් වටිනාකම් අතර වෙනස්කම් පිළිබඳ සොයා බලා කටයුතු කළ යුතු වීම | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |
| (ආ) මාතර නිල්වලා නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාර්ග 20 ක් සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.16,075,405 ක් වූ වටිනාකමකට ගිවිසුම්වලට එළඹ තිබුණ ද ඉන් මාර්ග 11 ක් නිම නොකර අතහැර දමා තිබුණි. ගිවිසුම් පැහැර හැරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගිවිසුම් කඩකර ව්‍යාපෘති අතර මඟ නතර කර ඇති කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් කාලීනව ක්‍රියාමාර්ග ගෙන රජයට විය හැකි පාඩු අවම කිරීමට කටයුතු කළ යුතුය. | ගිවිසුම් කාලය දීර්ඝ කිරීම ප්‍රමාදවීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්කරුට මෙම කාණ්ඩයේ වැඩ ඉටුකළ නොහැකි බව දැක්වීමෙන් පසු ගිවිසුම් අවලංගු කළ බවත් අවිච්ඡේද ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලැබුණේ 2018 ජූලි 16 දින බවත්. |
| (ඇ) 2017, 2018 හා 2019 වර්ෂවල පවුල් 294 ක් නැවත පදිංචි කිරීම් වෙනුවෙන් වැය විෂයය අංක 130-02-08-12-2202 යටතේ 2019 දෙසැම්බර් 31 දිනට එකතුව වූ රු.361,933,604 ක වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක 2017 වර්ෂයේ නැවත පදිංචි කිරීම් කළයුතු පවුල් 1,084 ක් හඳුනාගෙන තිබුණි. එහෙත් 2018 දෙසැම්බර් 31 දිනට පවුල් 435 ක් ද, 2019 දෙසැම්බර් 31 දිනට පවුල් 418 ක් ද ලෙස එම සංඛ්‍යාව අඩුවීමට හේතු මෙන්ම වාර්ෂිකව අළුතින් හඳුනාගත් පවුල් සංඛ්‍යාවට අදාල තොරතුරු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි හා යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යායුතු අතර ඒ පිළිබඳ නිවැරදි අධීක්ෂණයක් සිදුකළ යුතුය. | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |
| (ii) මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉඩමක් මිලදී ගැනීම සඳහා ප්‍රතිලාභියෙකු වෙත රු.400,000 ක් ලබාදී තිබුණි. එසේම තවත් ප්‍රතිලාභියකුට ලබා දුන් ආධාරවලින් ඔහුගේ පුතාගේ ඉඩම රු.400,000 කට මිලදී ගෙන නිවස ඉදිකිරීම වෙනුවෙන් තවත් රු.500,000 ක් ද ලබා ගෙන තිබුණි. එසේ වුවද මෙම ප්‍රතිලාභීන් දෙදෙනාම 2019 දෙසැම්බර් මස වනවිටත් නිවාස ඉදිකිරීම් හා අවදානම් ස්ථානයෙන් ඉවත්වීම සිදුකර නොතිබුණි. | මූලාධාර ලබාදීමේදී ප්‍රතිලාභියාට සහන සැලසීම මෙන්ම මුදල් රෙගුලාසි සම්බන්ධයෙන් ද අවධානය යොමුකළ යුතු අතර ආධාර ලබාදුන් අරමුණ ඉටුවී තිබේද යන්න පරීක්ෂා කළ යුතු වේ. | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |

| | | | |
|---|---|---|---|
| (iii) | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නායයෑම් අවදානම් හඳුනාගත් ඉඩමක කොටසක් නැවත පදිංචිය සඳහා සුදුසු බවට නිර්දේශ ලබාදී තිබියදී අළුතින් ඉඩමක් මිලදී ගැනීම සඳහා රු.400,000 ක් ලබාදී තිබුණි. | භූ සමීක්ෂණ වාර්තාවල ලබාදී තිබූ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |
| (iv) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් පුද්ගලයකුගේ නිවස, භූ සමීක්ෂණ වාර්තාව අනුව අළුත්වැඩියාවන් සිදුකර නැවත භාවිතයට නිර්දේශ ලබාදී තිබුනද මධ්‍යම නායයාම් අවදානම් සහිත වෙනත් ඉඩමක් මිලදී ගැනීම සඳහා රු.1,600,000 ක් ලබාදී තිබුණි. | භූ සමීක්ෂණ වාර්තාවල ලබාදී තිබූ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |
| (v) | දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැනැත්තෙකු වෙත නිවසක් සහිත ඉඩමක් මිලදී ගැනීම සඳහා රු.1,558,000 ක් ලබාදී තිබුනද මිලදීගත් ඉඩමේ ඔප්පුව විගණනයට ඉදිරිපත් නොවුණි. | ප්‍රතිලාභියාට ලබාදුන් ආධාර වෙනුවෙන් අවශ්‍ය මූලික ලේඛන නිවැරදිව ලබාගත යුතුය. | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |
| (vi) | ආපදාවලින් විපතට පත්වූ ජනතාව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ මෙන්ම අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ද අවධානය යොමුවී නොතිබූ කරුණු පහත දැක්වේ.<br>• ප්‍රතිලාභීන් අවදානම් ස්ථානවලින් ඉවත් කිරීම හා නැවත පදිංචි කිරීම සඳහා ගතකළ යුතු කාලය<br>• මූල්‍යාධාර යටතේ ගත් දේපල විකිණීමට හා අන්සතු කිරීමට හැකිවීමත<br>• භූ සමීක්ෂණ වාර්තා මගින් ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම.<br>• අවතැන්වූවන්ගේ නාමලේඛනය හා නිවාස ආධාරලාභීන්ගේ නාමලේඛනයක් නඩත්තු නොකිරීම | චක්‍රලේඛ මගින් ආවරණය නොවුනද නැවත පදිංචි කිරීමේදී මතුවන ගැටළු හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ගතයුතු නිවැරදි ක්‍රියාමාර්ග තීරණය කර කඩිනමින් ඒවා ක්‍රියාත්මක කළ යුතුය. | පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව. |
| (ඇ) | දක්ෂිණ කලාපීය සංවර්ධන වැඩසටහන යටතේ දෙව්නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වෙන්කර තිබූ රු.3,750,000 ක් වූ ව්‍යාපෘති 04 ක් ඉටුකර නොතිබුණි. | ව්‍යාපෘති සැලැසුම්කර නියමිත කාලය තුල ක්‍රියාත්මක කළ යුතුය. | ඇස්තමේන්තු නියමිත දිනට ඉදිරිපත් නොවීම, ඉඩම් නිරවුල් නොවීම, අවශ්‍යතාවයන් ප්‍රමාදවී ඉදිරිපත් කිරීම සහ ඉදිකිරීම් මීට පෙර සිදු කිරීම යන හේතු නිසා ව්‍යාපෘති අත්හැර දැමීමට සිදුවී ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රු.1,000,000 ක ප්‍රතිපාදන හා දක්ෂිණ කලාපීය සංවර්ධන වැඩසටහන 2018 අවිච්ඡේද ව්‍යාපෘති යටතේ රු.1,000,000 ක ප්‍රතිපාදන මත වැලිගම ආරුශියා මාවත කාණු පද්ධතිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) | අවිච්ඡේද ව්‍යාපෘතිය සඳහා 2019 සැප්තැම්බර් 25 දින ගිවිසුම්ගතවී විධිමත් අනුමැතියකින් තොරව රු.999,844 ක් වූ ඇස්තමේන්තුවෙහි වැඩ විෂයයන් සංශෝධනය කර තිබුණි. | ව්‍යාපෘතිය නිශ්චිතව හඳුනාගත යුතු අතර ඇස්තමේන්තු සංශෝධනය සඳහා අනුමැතිය ලබාගත යුතුය. | නිරීක්ෂණය පිළිගෙන ඇත. දළ සටහන් සහ ව්‍යාපෘතියේ සීමාවන් ලොග් සටහන් පොතෙහි දක්වා ඇති බවත්. |
| (ii) | කොන්ත්‍රාත්කරුගේ විස්තර පත්‍රිකාවේ දැනට පැවරී ඇති කොන්ත්‍රාත් හා පසුගිය වසර තුල ඉටුකරන ලද කොන්ත්‍රාත් පිළිබඳ විස්තර දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 අනුව කටයුතු කළ යුතුය. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (iii) | 2020 ජනවාරි 30 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.<br>• කාණුවේ ස්ථාන 02 ක කොන්ක්‍රීට්වලට යොදා තිබූ යකඩ කම්බි නිරාවරණය වී තිබුණු අතර කොන්ක්‍රීට් ආවරණ මාර්ගයේ උසට වඩා අඟල් 05 ක් පමණ ඉහළින් පැවතුණි. | කර්මාන්ත ඉදිකිරීමේදී එහි ප්‍රමිතිය හා අපේක්ෂිත අරමුණු පිළිබඳ සැලකිල්ලට ගත යුතුය. | තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව කොන්ක්‍රීට් ආවරණ පාර මට්ටමට නිවැරදි කර ඇති බව. |
| | • අඟල් 4 හා 5 ඝණකම් සහිත කොන්ක්‍රීට් ආවරණ 92 කට ගෙවීම සඳහා නිර්දේශ කර තිබුන ද කාණුව මත ආවරණ 71 ක් පමණක් තබා තිබුණි. තවත් ආවරණ 12 ක් මාර්ගයේ උරහිස් මත තබා තිබූ අතර 09 ක් භෞතිකව නොතිබුණි. | ගෙවීම් සිදු කිරීමේදී ඇස්තමේන්තුව ප්‍රකාරව නියමිත ප්‍රමිතියට ඉදිකිරීම් සිදුකර තිබේද යන්න තහවුරු කරගත යුතුය. | උරහිස් ප්‍රදේශයේ තබා තිබූ කොන්ක්‍රීට් ආවරණ 04 සහ 08 මේ වනවිට නිසි පරිදි ස්ථානගත කර ඇති බවත් භෞතිකව නොපවතින ආවරණ 09 හි වටිනාකම බිල්පතෙන් අඩුකර ගෙවීමට කටයුතු කරන බවත්. |
| | • කාණුව මීටර් 15 ක පමණ දුරට කොන්ක්‍රීට් කිරීම් අධීක්ෂණයෙන් බැහැරව සිදුකර තිබුන ද මේ සම්බන්ධව තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | ඉදිකිරීම් සඳහා ගෙවීම් සිදු කිරීමේදී ඇස්තමේන්තුව ප්‍රකාරව සිදුකර තිබේද යන්න තහවුරු කරගත යුතුය. | මෙම මීටර් 15 තාක්ෂණ නිලධාරී දැනුවත් කිරීමකින් තොරව සිදුකරන ලද්දක් බැවින් බිල්පතෙහි ගෙවීම් සඳහා ඇතුළත් කර නොමැති බව. |

| | | |
|---|---|---|
| • කර්මාන්තයට යොදන ලද 1:2:4 කොන්ක්‍රීට්වල තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා නොගෙන ගෙවීම් නිර්දේශ කර තිබුණි. | නියමිත තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගෙන ගෙවීම් සිදුකළ යුතුය. | මින් ඉදිරියට මෙවැනි ඉදිකිරීම් සඳහා ද තත්ත්ව පරීක්ෂණ සිදු කිරීමට තාක්ෂණ නිලධාරීන් දැනුවත් කළ බව. |

**2.3** **තැන්පත් ශේෂයන්**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------------------------ |
| (අ) | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 වර්ෂයේ ජුනි 12 සිට දෙසැම්බර් 31 දක්වා ලබාගත් ලංසු සුරක්ෂණ තැන්පතු 34 ක එකතුව වූ රු.1,022,296 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිට තැන්පතුකරුවන්ට ගෙවීමට හෝ මුදල් රෙගුලාසි 571 පරිදි කටයුතු කර නොතිබුණි. | තැන්පතු ශේෂයන් සම්බන්ධව විධිමත්ව හා කාලීනව කටයුතු කළ යුතුය. | භාණ්ඩාගාරය වෙතින් වර්ෂය තුලදී ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම හේතුවෙන් අදාල තැන්පත්කරුවන් වෙත ගෙවීමට නොහැකි වූ බව. |
| (ආ) | ආපදා සහන සැලසීම යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ ප්‍රතිපාදන ඉතිරිවීම් එකතුව වූ රු.1,955,682 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | තැන්පතු ශේෂයන් සම්බන්ධව විධිමත්ව හා කාලීනව කටයුතු කළ යුතුය. | මේ වනවිට නිරවුල් නොවී පවතින ශේෂ ඉදිරියේදී නිරවුල් කිරීමටත් ඉතිරි මුදල් රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කර ඇති බවත්. |
| (ඇ) | අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2017 ගංවතුරෙන් හානියට පත් නිවාස ආධාර හිමි ප්‍රතිලාභියකුට වෙන් කරන ලද රු.1,600,000 ක මුදල 2018 මාර්තු 07 දින සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | තැන්පතු ශේෂයන් සම්බන්ධව විධිමත්ව හා කාලීනව කටයුතු කළ යුතුය. | පුද්ගලයින් දෙදෙනෙකු සඳහා ඉඩමක් මිලදී ගැනීමට වෙන්කර තිබූ මුදල් ඔවුන් දෙදෙනාගේ ඥාතීත්වය අනාවරණය වූ පසු එක් අයෙකුට රු1,200,000 ක් පමණක් ලබාදී ඉතිරිය රාජ්‍ය ආදායමට ගැනීමට උපදෙස් ලබාදුන් බව. |

**2.4** **බැංකු ගිණුම් මෙහෙයවීම**

**----------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | -------------- | ------------------------------------ |
| 2019 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජංගම ගිණුමේ රු.4,597,305 ක ශේෂයක් රඳවාගෙන තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මුදල් පොතේ ශේෂය නිවැරදි විය යුතුය. | මෙම ගිණුම ස්වයංක්‍රියව දෛනික බැංකු ශේෂය මාරුවන බැංකු ගිණුම් පද්ධතියට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව |

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1. සැලැසුම් කිරීම
----------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ගොඩනැගිල්ල ඉදිකිරීම් (2104) වෙනුවෙන් 2019 වර්ෂයේදී රු.120,700,000 ක ප්‍රතිපාදන වෙන්වී තිබුන ද 2019 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.44,245,750 ක් ඉතිරිවී තිබුණි. එම ඉතිරිය ප්‍රතිපාදන මුදලින් සියයට 37 ක් වී තිබුණි. | සැලැසුම් කරන ලද පරිදි කාර්යභාරයන් ඉටුකළ යුතුය. | පිටබැද්දර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉදිකිරීම කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය නිසා ද තිහගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වැඩ අවසන් වුවද බිල්පත් ඉදිරිපත් නොවීම නිසා ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉදිකිරීම් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොදීම නිසාද මෙම ඉතිරිවීම් සිදුවී ඇති බව. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව පහත විස්තර සඳහන් ඉදිකිරීම් සිදුකර අවසන් කළ බව දක්වා තිබුණි. විගණනය වෙත ලබා දී තිබූ වියදම් විස්තර අනුව ප්‍රතිපාදන ඉතිරිවීම් දක්නට ලැබුණු නමුත් අතැති බිල් හෝ ගෙවීමට ඇති බැදීම් සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.<br>• තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම<br>• දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල ඉදිකිරීම I අදියර හා II අදියර ඉතිරි වැඩ<br>• මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කොරිඩෝව ඉදිකිරීම | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිකිරීම් සිදුකර අවසන් නොමැති වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල අතැති බිල්පත් හෝ ගෙවීමට ඇති බැදීම්, බැරකම් ලෙස දැක්විය යුතුය. | තිහගොඩ, දික්වැල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාල ඉදිකිරීම් 2019 වර්ෂයේ අවසන් කළ ද අඩුපාඩු පැවතීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත් නොවීමත් එම වටිනාකම් 2020 අවිච්ඡේද යටතේ දක්වා ඇති බවත්, මාලිම්බඩ දික්වැල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඇස්තමේන්තුවට වඩා අඩුවෙන් වැඩ අවසන් කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බවත්, ඒ අනුව අතැති බිල්පත් බැදීම් බැරකම් ලෙස පෙන්නුම් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත්. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සැලසුම් කළ ආකාරයට සිදු නොකිරීමෙන් රු.4,000,000 ක මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් ඉටුකළ යුතුය. | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකිවීම නිසා මෙම මුදල ඉතිරි වූ බව. |
| (ආ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම (2001) යටතේ දැක්වෙන ඇස්තමේන්තු වටිනාකම රු.707,000 ක් වූ ක්‍රීඩා අංශය අළුත්වැඩියා කිරීමේ කාර්යය ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රතිඵලය අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රීඩා අංශය පවත්වාගෙන යන ගොඩනැගිල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් බැවින් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ ද අදාල රේඛීය අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන ලබාගත නොහැකිවීම නිසා මෙම කාර්යය ඉටු නොකරන බව. |

**3.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම | | |
| **(i)** | ගිවිසුමේ වගන්ති අංක 17.1 ට අනුව 2016 දෙසැම්බර් 28 දින සිට කර්මාන්තය නිම කළ යුතු කාලය දින 546 ක් වුවද අනුමැතිය රහිතව අවස්ථා 06 කදී දින දීර්ඝ කිරීම් සිදුකර තිබුණි. එසේ වුවද ගිවිසුමේ වගන්ති 4.9.1 අනුව ප්‍රමාද ගාස්තු (Liqudated damages) ලෙස දිනකට රු.120,000 ක අයවීම් කළයුතු වුවද එසේ සිදුකර නොතිබුණි. | ඉදිකිරීම් නියමිත කාලය තුළ නිමකරවා ගැනීමට කටයුතු කළ යුතුය. කාලය දීර්ඝ කිරීම් සඳහා අනුමැතිය ලබාගත යුතු අතර ගිවිසුමේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(ii)** | ගිවිසුමේ වගන්ති 27.1 අනුව දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු වැඩසටහන Programme for the works ඉදිරිපත් කර නොතිබුණ අතර ඒ සඳහා පසු ක්‍රියා මාර්ග ලෙස ගිවිසුමේ වගන්ති 27.4 අනුව කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 2 ක් රඳවාගැනීම් කර නොතිබුණි. සෑම මාසයකදීම ඉදිරි වැඩසටහන කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන නොතිබුණි. | සෑමවිටම ගිවිසුම ප්‍රකාරව කටයුතු සිදුකළ යුතු අතර ගිවිසුම උල්ලංඝනය වූ විට එහි දක්වා ඇති පරිදි ක්‍රියා කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

| | | |
|---|---|---|
| **(iii)** ගිවිසුමේ වගන්ති 13.1 සහ 13.2 ප්‍රකාරව රක්ෂණ ගිවිසුම විගණනයට ඉදිරිපත් නොවූ අතර 2019 ජූලි 31 දින වනවිට රක්ෂණ ගිවිසුම් කල් ඉකුත්වී ඇති බව පමණක් ගොනුවේ සඳහන් කර තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව රක්ෂණ ගිවිසුම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(iv)** ලංසු ලේඛනයේ උපලේඛන 5 අනුව Bidding data & Contract data සාමාන්‍ය විස්තර (General) යටතේ 9.1 වගන්තිය අනුව අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩල විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි. තවද පරීක්ෂා කරන ලද බිල්පත් අංක 12 අනුව රු.151,086 ක් කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවීමට ඉදිරිපත් කර තිබුණි. | අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩල විස්තර ලබාගත යුතු අතර ඒ සඳහා ගෙවීම් කිරීමට පෙර ගිවිසුමේ දක්වා ඇති වගන්ති අනුව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ආ) පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම<br>------------------------------------------------------------ | | |
| **(i)** මෙම ඉදිකිරීම සඳහා රු.44,785,376 කට ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත්තුව 2019 අගෝස්තු 22 දිනට ඉදිකිරීම් අවසන් විය යුතු වුවද 2019 නොවැම්බර් 30 දිනට භෞතික ප්‍රගතිය සියයට 10 ක් විය. තවද නැවත 2020 ජනවාරි 02 දක්වා දින දීර්ඝ කර තිබුන ද ඉදිකිරීම් නිමකිරීමට ඇති හැකියාව හා රජයට වන මූල්‍ය පාඩු/හානි සම්බන්ධව අවධානය යොමු කර නොතිබුණි. | ගිවිසුම් කාලය අසාමාන්‍ය ලෙස දීර්ඝ කිරීමේදී එම දීර්ඝ කරනලද කාලය තුල ඉදිකිරීම් සිදු කිරීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමුකළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(ii)** වැඩබිමට දෛනික කම්කරු වැඩ ලේඛනය හා උපකරණ පිළිබඳ වාර්තා, තොග ලේඛන කිසිවක් කොන්ත්‍රාත්කරු විසින් නඩත්තු කර නොතිබුණි. | වැඩ බිම තුල පවත්වා ගතයුතු ලේඛන, තොග වාර්තා නිසි පරිදි තබා ගැනීමට උපදෙස් ලබාදිය යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(iii)** ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කණ්ඩිය කැපීම හේතුවෙන් නායයෑමේ අවදානමක් පවතින බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් 2019 ඔක්තෝබර් 22 දිනැති වාර්තාවේ දක්වා තිබුන ද ඒ සඳහා අවධානය යොමුකර නොතිබුණි. | භූ සමීක්ෂණ වාර්තාවේ දක්වා ඇති ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(iv)** අත්තිකාරම් සුරක්ෂණයේ කාලය 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණ ද 2019 නොවැම්බර් 30 දින වනවිට ගෙවන ලද අත්තිකාරම් මුදලින් රු.11,333,175 ක (වැට් සහිත) මුදලක් අයකර ගැනීමට ඉතිරිව තිබුණි. | රජයට ඇතිවිය හැකි පාඩු කලින් හඳුනාගෙන ඒවා අවම කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

**3.4** **ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) (i) | ඇස්තමේන්තු වටිනාකම රු.100,940,000 ක් වූ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සීමාව ඉක්මවන බැවින් රු.99,971,000 කට සංශෝධිත ඇස්තමේන්තුවක් සකස් කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවළිය මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය සහ ඵලදායිත්වය උපරිම කිරීම යන අරමුණු මගහැරී තිබුණි. | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සැකසිය යුතු අතර යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ii) | ඇස්තමේන්තු මුදල පදනම් කරගෙන රු.51,908,831 කට කොන්ත්‍රාත්තුව පිරිනැමීම මෙන්ම අනෙකුත් ලංසු ප්‍රතික්ෂේප කිරීමට අදාළ හේතු සටහන් කිරීම සහ කොන්ත්‍රාත් පිරිවැය සියයට 48 කින් අඩුවීම සඳහා පිරිවැය විශ්ලේෂණයක් ලබා ගැනීම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදු කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව ඇස්තමේන්තු වටිනාකමට වඩා කොන්ත්‍රාත්කරුගේ පිරිවැය විශාල ලෙස අඩුවන අවස්ථාවලදී පිරිවැය විශ්ලේෂණයක් ලබාගත යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ආ) | ඇස්තමේන්තු වටිනාකම රු.73,600,000 ක් වූ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.44,785,376 කට 2018 නොවැම්බර් 15 දින ගිවිසුම්ගතවී තිබූ අතර කර්මාන්තයේ වැඩ 2019 අගෝස්තු 22 දින නිමකළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** | ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කළ උපදේශක ආයතනය ලෙස කටයුතු කළ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ලංසු ඇගයීමට සහභාගි කරගෙන නොතිබුණි. එසේම ඉදිකිරීම් කටයුතු සඳහා වූ භූමිය උපදේශක ආයතනය විසින් පරීක්ෂා කර භූමියේ ප්‍රමාණය හා යෝග්‍යතාවය පිළිබඳ කරුණු දැක්වීමක් සිදුකර නොතිබුණි. | ලංසු ඇගයීමේදී උපදේශක ආයතනය සහභාගි කර ගත යුතුය. ඇස්තමේන්තු සැකසීමට පෙර අදාල උපදේශක ආයතනය විසින් අදාල භූමිය පරීක්ෂා කිරීම කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(ii)** | ලංසු විවෘත කිරීමේ වාර්තා හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා අනුව ඉදිරිපත් කර තිබූ ලංසු 06 න් අවම මිල මත පදනම් කරගෙන කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදුකර තිබුණු අතර අනෙකුත් ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතු ප්‍රසම්පාදන කමිටුව විසින් දක්වා නොතිබුණි. | කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී ඒ පිළිබඳ නිශ්චිත හේතු දැක්විය යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | කොන්ත්‍රාත්කරුගේ පිරිවැය ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 12 කින් රු.6,344,705 කින් අඩු වුවද ඒ සම්බන්ධයෙන් පිරිවැය විශ්ලේෂණයක් ලබාගෙන නොතිබුණි. | ඇස්තමේන්තු වටිනාකමට වඩා කොන්ත්‍රාත්කරුගේ පිරිවැය අඩුවන අවස්ථාවලදී පිරිවැය විශ්ලේෂණයක් ලබාගත යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(iv)** | ලංසු ලේඛනයේ උපලේඛන 5 Bidding data & Contract data (General) 9.1 වගන්තිය අනුව අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩල විස්තර විගණනයට ඉදිරිපත් නොවූ අතර එම වගන්තියට අනුකූල නොවීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එසේම ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොයෙදීම මත කොන්ත්‍රාත්තුව අසාමාන්‍ය ලෙස ප්‍රමාදයක් පවතින බව ද නිරීක්ෂණය විය. | කාර්ය මණ්ඩලය පිළිබඳ ප්‍රමාණවත් හා නිවැරදි තොරතුරු ලබාගත යුතු අතර ඒ අනුව ක්‍රියා නොකරන අවස්ථා සඳහා පසු ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(v)** | කොන්ත්‍රාත් ගිවිසුමේ වගන්ති 13.1 සහ 13.2 අනුව ඉදිරිපත් කළයුතු විධිමත් රක්ෂණ ගිවිසුම ඉදිරිපත් නොවූ අතර ඉදිරිපත් කරන රක්ෂණ ගිවිසුමේ කාලය ඉක්මවා ගොස් තිබුණි. | ගිවිසුම ප්‍රකාරව රක්ෂණ ගිවිසුම ලබාගත යුතු අතර එය කාලීනව පවත්වා ගත යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(vi)** | ගිවිසුමේ වගන්ති 27.1 අනුව Programme for the works ඉදිරිපත් කර නොතිබුණු අතර ඊට අනුකූල නොවීම සඳහා වගන්ති 27.4 අනුව කටයුතු කර නොතිබුණි. එසේම සෑම මාසයකදීම යාවත්කාලින කරනලද Programme for the works කොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව ලබාගත යුතු Programme for the works ලබාගත යුතු අතර එසේ නොවන විට ඒ සඳහා ගිවිසුම අනුව පසු ක්‍රියා මාර්ග ගත යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ඇ) | මාතර දිස්ත්‍රික් ක්‍රම සම්පාදන ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂයේ වැඩසටහන් 27 කට අදාලව සංවර්ධන ව්‍යාපෘති 6,542 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 6,785 ක් අනුමත වී තිබූ අතර ඒ සඳහා රුපියල් මිලියන 1,998 ක් වැයකර තිබුණි. එම ව්‍යාපෘතිවලට අදාල ප්‍රසම්පාදන ක්‍රියාවළිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| **(i)** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 4.2 වගන්තිය අනුව ප්‍රසම්පාදන සූදානම හා සැලසුම් කිරීම යටතේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | සියළුම ව්‍යාපෘති ආවරණය වන ලෙස ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

| | | |
|---|---|---|
| **(ii)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 2.11.1 අනුව ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණ ඇගයීම් කමිටුවේ ඒකාබද්ධ පළමු රැස්වීමක් පවත්වා ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කිරීම සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.11.1 අනුව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(iii)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 අනුව වාර්තාගත කිරීමේ කාර්යය සඳහා සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.11.1 අනුව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| **(iv)** වැඩසටහන් 08 කට අදාල ව්‍යාපෘති 44 කට ජාතික තරඟකාරී ලංසු කැඳවීම වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 වර්ෂයේ සිදුකළ ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන කමිටු /තාක්ෂණ ඇගයීම් කමිටු දීමනා ලෙස රු.2,529,000 ක් ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 මාර්ගෝපදේශයේ දක්වා ඇති කරුණු සපුරා නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.9.1 හි උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව දක්වා ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) රජයේ ඉඩම් ලෙස හඳුනාගත් ඉඩම් සහ අනෙකුත් ඉඩම් ප්‍රමාණයන් පිළිබඳ ලේඛනයක් හෝ තොරතුරු පද්ධතියක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 විසින් පවත්වා නොතිබුණි. | රජයේ ඉඩම් නිශ්චිතව හඳුනාගෙන ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ආ) ඉඩම් නියෝග අංක 180 යටතේ ග්‍රාම නිලධාරීන් වෙත පැවරෙන වගකීම් ඉටුකිරීමෙහිලා රජයේ ඉඩම් නිශ්චිතව හඳුනා ගැනීමට අදාල දත්ත පද්ධතියක් නොතිබීමෙන් අනවසර අල්ලා ගැනීම්, ගොඩකිරීම් සම්බන්ධව වාර්තා කිරීම ආදී කාර්යයන් ඉටු කිරීම මන්දගාමීව සිදුවී තිබෙන බව නිරීක්ෂණය විය. | රජයේ ඉඩම් නිශ්චිතව හඳුනාගෙන ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ඇ) රජයේ ඉඩම් දීර්ඝකාලීන බදුදීම් සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක ගොනු 194 ක් නඩත්තු කර තිබුණු අතර ගොනු 08 ක පමණක් දීර්ඝකාලීන බදුකර සකස්කර රජයට ආදායම් අයකරමින් පැවතුණි. | දීර්ඝකාලීන බදුකර සැකසීමේ කාර්යය නිසි අධීක්ෂණයකින් කාලීනව ඉටු කිරීම තුලින් ඉඩම්වලින් රජයට උපයාගත හැකි ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ ඉඩම් පිළිබඳ දත්ත e–Slims නැමැති තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීම 2016 ඔක්තෝබර් මස අවසානය වනවිට සිදුකළ යුතු වුවද කඹුරුපිටිය, කිරින්ද පුහුල්වැල්ල, දික්වැල්ල, මාතර, මාලිම්බඩ, හක්මණ සහ තිහගොඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් එම ඉලක්කය 2019 නොවැම්බර් 11 දින වනවිට ද සපුරා නොතිබුණි. | යොමුගත ලිපිය ප්‍රකාරව කටයුතු කළයුතු අතර අදාල කාර්යයන් කඩිනමින් නිමකළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ඉ) | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් නොමැති තැනැත්තන් සඳහා බෙදාදීමේ අරමුණින් ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ භූමි ප්‍රමාණය අක්කර 14 පර්චස් 28.9 ක් වූ ඉඩම් 04 ක් සඳහා 2014 හා 2015 වර්ෂවල රුපියල් මිලියන 70.7 ක් වන්දි ලෙස ගෙවා අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර තිබුන ද 2019 ඔක්තෝබර් 30 දින වනවිටත් අත්පත් අරමුණ සඳහා නොයොදවා එම ඉඩම් නිෂ්කාර්යව පැවතුණි. | ඉඩම් සම්බන්ධ කාර්යයන් සිදුකිරීමේදී කාලීනව පසු විපරම් සිදුකර කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ඊ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය පරිදි සකසන ලද ඉඩම් නොමැත්තන් ලියාපදිංචි කිරීමේ ලේඛන අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක සුදුසුකම් ලැබූ පුද්ගලයින් 11,033 ක් හඳුනාගෙන සිටි අතර එම ඉල්ලුම්කරුවන් වෙත (මාතර, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැර) බෙදාදීමට ප්‍රමාණවත් ඉඩම් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නොමැති බැවින් උක්ත චක්‍රලේඛයේ 2.3 හි සඳහන් ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | යොමුගත චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

## 3.6 පාඩු හා හානි

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එකතුව රු.343,435 ක් වූ වාහන අනතුරු 03 ක් සම්බන්ධ ඉදිරි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | යොමුගත චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | එක් වාහනයක සත්‍ය අලාභය වාර්තා නොවීම නිසා ද, තවත් වාහනයක නඩු විභාගය අවසන් වී නොමැති නිසා ද අනෙක් වාහනයේ අවසාන පරීක්ෂණ මණ්ඩල වාර්තාව නොලැබීම නිසා ද මෙම තත්ත්වය ඇති වී ඇති බව දක්වා ඇත. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු කැබ්රථයක් 2018 ජනවාරි 01 දින විධිමත් අවසරයක් ලබා නොගෙන රියදුරු විසින් ධාවනය කර සිදුවූ අනතුරු 02 ක් නිසා රියදුරුගේ වැඩ තහනම් කර තිබුණි. එහෙත් අනතුර සිදුවී වසර 02 කට වැඩි කාලයක් ඉක්ම ගොස් තිබුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභයේ එකතුව වූ රු.882,394 ක් පොත්වලින් | යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කඩිනමින් ක්‍රියා කළ යුතුය. | මු.රෙ.104(4) අවසන් පරීක්ෂණ වාර්තාව ලැබී ඇති අතර ඉදිරි කටයුතු කඩිනමින් අවසන් කරන බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| | කපාහැරීමට/ අයකර ගැනීමට හා ඊට අදාළ වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම දිගින් දිගටම ප්‍රමාදවී තිබුණි. එසේ වුවද අදාල රියදුරු 2019 නොවැම්බර් 21 දින විශ්‍රාම ගන්වා ඇත. | | |
| (ඇ) | 2017 වර්ෂයේ දී ඇතිවූ ගංවතුර හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට සිදුවී ඇති රු.102,300 ක් වූ හානිය පොත්වලින් කපා හැරීමට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | පාඩු හා හානි සම්බන්ධව කඩිනමින් ක්‍රියා මාර්ග ගත යුතුය. | අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් විසින් මූලික වාර්තා ඉදිරිපත් කිරීමේදී සිදුවූ ප්‍රමාදය මේ සඳහා හේතු වූ බවත් ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට උපදෙස් ලබාදී ඇති බව. |
| (ඈ) | 2019 දෙසැම්බර් 31 දිනට වාහන අනතුරු හැර එකතුව රු.16,026,607 ක් වූ හානි හා පාඩු, වසර 02 - 36 දක්වා කාලයක සිට ඉදිරියට ගෙනෙමින් පැවතියද කපා හැරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාඩු හා හානි සම්බන්ධව කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. | නඩු කටයුතු අවසන් නොවීමත්, මු.රෙ.104(4) වාර්තා ප්‍රමාදවීමත් ඇතැම් ගොනුවල වාර්තා සොයාගත නොහැකි වීමත් මෙම තත්ත්වයට හේතුවී ඇති බැවින් ඉදිරියේදී කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත්. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ------------------ |
| (අ) | වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රූඩ් 02 පර්.11 ක බිම් ප්‍රමාණයක් තිස් අවුරුදු බදු ගිවිසුමක් යටතේ බදු දී 2017 අගෝස්තු 09 දිනට අවුරුදු 30 නිමවී ඇතත් බදු ගිවිසුම් අළුත් කිරීමට සහ 2017 වර්ෂයෙන් පසු බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාලීනව බදු ගිවිසුම් අළුත් කිරීම ද සිදුකර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ආ) | මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩිහ නැගෙනහිර සහ බටහිර වසම්වලට අයත් අක්කර 02, පර්චස් 19 ක් වූ සුදු කොහු කර්මාන්ත ශාලාව පවත්වා තිබූ ඉඩම 1976 වර්ෂයේ ඉඩම් අත්කර ගැනීමේ පනත අනුව රජයට අත්කර ගෙන තිබුණද එම ලිපිගොනුව විගණනයට ඉදිරිපත් නොවුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් විය. | | |
| | **(i)** රූඩ් 01 පර්චස් 36 ක් වූ භූමියේ සමෘද්ධි අධිකාරිය මගින් රු.2,139,000 ක් වැයකර සමෘද්ධි මහා සංගම් කාර්යාලය ඉදිකර වසර 18 ක පමණ කාලයක් පවත්වාගෙන ගොස් තිබුණ ද ඒ සඳහා විධිමත් අවසරයක් හෝ බුක්තිය භාරදීමක් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සිදුකර නොතිබුණි. | රජයේ ඉඩම් පවරාදීමේදී අනුගමනය කළයුතු විධිමත් ක්‍රමවේදයක් අනුව කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2015 වර්ෂයේ සිට සමෘද්ධි මහා සංගම් කාර්යාලය වෙනත් ගොඩනැගිල්ලක පවත්වාගෙන ගොස් තිබුනද ප්‍රාදේශීය ලේකම්වරයා විසින් උක්ත ඉඩම හා ගොඩනැගිලි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිශ්ක්‍රීය ඉඩම් ගොඩනැගිලි කාලීනව පවරාගෙන ඵලදායීව භාවිතා කළ යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (iii) | ප්‍රාදේශීය ලේකම්වරයා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ විධිමත් අනුමැතියක් නොමැතිව ඉඩම අත්පත් කරගෙන අරමුණින් බැහැරව සමෘද්ධි අධිකාරියට මෙන්ම දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශයට ඉඩමේ බුක්තිය භාරදීමට කටයුතු කර තිබුණි. | රජයේ ඉඩම් පවරා දීමේදී ඉඩම් කොමසාරිස්වරයාගේ අනුමැතිය සැමවිටම ලබා ගත යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ඇ) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සවිකර තිබූ විදුලි සෝපානය සඳහා සවිකිරීමේ වියදම, නඩත්තු වියදම සහ සේවා කිරීම් වියදම ලෙස වාර්තා වී ඇති එකතුව රු.4,082,211 ක මුදලක් වැයකර තිබුණ ද 2015 මාර්තු මස නව කාර්යාලය විවෘත කර දින සිට මේ දක්වාම විදුලි සෝපානය අක්‍රියව පවතින බැවින් ඉහත මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය. | රජයේ මුදල් කාර්යක්ෂම ලෙස යෙදවිය යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (i) | පැවති සේවා ගිවිසුම අනුව සිදුකළ සේවා වාර, නඩත්තු කළ දිනයන් සහ අමතර සේවා සම්බන්ධව ලේඛනයක් හෝ සටහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. | නියමිත පරිදි ලේඛන පවත්වා ගත යුතු අතර එම ලේඛන යාවත්කාලීන විය යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |
| (ii) | මෙම සෝපානයට අදාල බිල්පත් ගෙවීමට පෙර එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධව වාර්තාවක් ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ලබාගෙන නොතිබුණු අතර සියයට 10 රඳවුම් මුදල් නිදහස් කිරීමට පෙර එහි ක්‍රියාකාරිත්වය ද සළකා බලා නොතිබුණි. | ගෙවීම් කිරීමට පෙර සෝපානයේ ක්‍රියාකාරිත්වය නිවැරදිව පරීක්ෂා කර වාර්තාවක් ලබාගත යුතුය. | විගණන නිරීක්ෂණ සඳහා අදාල අංශ මගින් පිළිතුරු ලද වහාම ඉදිරිපත් කරන බව. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළඟාකර ගතයුතු අරමුණු සහ ඉලක්ක කරා ළඟාවීමේ සූදානම පිළිබඳ පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 සම්බන්ධයෙන් 2019 වර්ෂය තුළ අවධානය යොමුකර නොතිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා වන තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. |

**5.** **යහපාලනය**

**5.1** **මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ තුළින් අවශ්‍ය දැනුවත් කිරීම් හා මහජනයාගේ පැමිණිලි ලබාගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. | වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. |
| (ආ) | මහජනයා විසින් ඉදිරිපත් කරනලද පැමිණිලි සම්බන්ධයෙන් මහජන පැමිණිලි ලේඛනයක් පවත්වා නොතිබුණි. | මහජන පැමිණිලි ලේඛනයක් පවත්වා ගත යුතුය. | පිළිතුරු පසුව ඉදිරිපත් කරන බව. |